# 5. කෘෂිකර්මය

*2000 වසර තුළ කෘෂිකාර්මික අංශය සියයට 1.2 ක වර්ධනයක් අත් කර ගනු ලැබීය. 1999 වසරෙහි වාර්තා වූ සියයට 4.5 ක වර්ධනය සමග සැසඳීමේදී මෙය මන්දගාමී වර්ධනයක් වූ අතර වී සහ රබර් නිෂ්පාදනයෙහි වූ පහත වැටීම මෙයට බලපෑ ප්‍රධාන හේතුව විය.*

*තේ*

▲ 1992 දී රජය සතුව තිබූ තේ වගාවන් පෞද්ගලීකරණය කිරීමත් සමග ඇති වූ තේ නිෂ්පාදනය ඉහළ යාමේ ප්‍රවනතාවය එලෙසම පවත්වා ගනිමින් 2000 වසර තුළදී තේ නිෂ්පාදනය ප්‍රථම වතාවට කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 300 ඉක්මවමින් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 306 ක නව වාර්තාගත මට්ටමක් අත්පත් කර ගන්නා ලදී.

▲ මෙය ඉකුත් වසරෙහි නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 7.8 ක වර්ධනයකි.

▲ සියළුම උන්නතාංශ කලාපවල නිෂ්පාදනය ඉහළ යාම තේ නිෂ්පාදනයෙහි ප්‍රගතියට දයක වූ අතර පහත් බිම් තේ නිෂ්පාදනයෙහි ඇති වූ වර්ධනය තේ නිෂ්පාදනයෙහි ඉහළ යෑමට බලපෑ ප්‍රධාන සාධකය විය.

▲ පසුගිය වසරෙහි තේ කිලෝ ග්‍රෑම් එකක් සඳහා ලැබුණු සාමාන්‍ය මිල වූ රු. 115.19 ට (එ.ජ.ඩොලර් 1.64) සාපේක්ෂව මෙම වසරේදී තේ කිලෝ ග්‍රෑම් එකක් සඳහා ලැබුණු සාමාන්‍ය මිල රුපියල් 135.53 (එ.ජ.ඩොලර් 1.79) ක් විය.

▲ අපනයන ඉපැයීම් තවදුරටත් ඉහළ නංවමින් 2001 වසරේදී තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 310 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

*රබර්*

▲ වසරේ පසු භාගයේදී රබර් මිල ගණන් ඉහළ ගියද 2000 වසරේ රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 89 ක් දක්වා සියයට 8 කින් පහත වැටුණි.

▲ පසුගිය වසර කිහිපය පුරා බලපැවැත්වූ අයහපත් මිල ගණන් හේතුවෙන් රබර් වගා අංශය තුළ පොහොර භාවිතයේ අහිතකර බලපෑමක් ඇති විය.

▲ දේශීය කර්මාන්ත අංශය තුළ පසුගිය වසර කිහිපය පුරා දක්නට ලැබුණු රබර් පරිභෝජනයෙහි වේගවත් වර්ධනය නොකඩවා පවත්වා ගනිමින්, 2000 වසර තුළදීද දේශීය කර්මාන්ත අංශය තුළ සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 62 ක් පරිභෝජනය කෙරිණි.

▲ 2001 වසරේදී රබර් මිල ගණන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර, රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 95 දක්වා සියයට 7 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තේ නිෂ්පාදනය




5.1 රූපසටහන

රබර් නිෂ්පාදනය




5.2 රූපසටහන

## පොල්

▲ 2000 වසරේ පොල් නිෂ්පාදනය ගෙඩි දශ ලක්ෂ 3,055 දක්වා සියයට 8 කින් ඉහළ ගිය අතර, එය මේ දක්වා වූ ඉහළම නිමැවුම ලෙස වාර්තාගත වී ඇත.

▲ නිෂ්පාදනයෙහි ඉහළ යාම මිල ගණන් කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කළේය.

▲ 2000 වසරේ කපාපු පොල් නිෂ්පාදනය සියයට 31 කින් ඉහළ ගිය අතර, පොල් තෙල් නිෂ්පාදනයද සියයට 27 කින් වැඩි විය.

▲ දැනට පවත්නා අයහපත් කාලගුණික තත්ත්වයෙහි පසුකාලීන බලපෑම හේතුකොටගෙන 2001 වසරෙහි පොල් නිෂ්පාදනය පහත වැටෙනු ඇතැයි බලාපොරොත්තු වේ.

පොල් නිෂ්පාදනය




5.3 රූපසටහන

## වී

▲ 1999 වසරෙහි ඉහළ මට්ටමක පැවැති නිෂ්පාදනයට සාපේක්ෂව 2000 වසරේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.9 දක්වා ආන්තිකව අඩු වීමක් පෙන්නුම් කරයි.

▲ 2000 වසරේ මාස් කන්නයේ අස්වැන්න සියයට 1 කින් ඉහළ ගිය අතර, යල් කන්නයේ අස්වැන්න සියයට 4 කින් පහත වැටුණි.

▲ වාර්ෂික ජාතික අස්වනු සාමාන්‍යය අක්කරයකට බුසල් 75 දක්වා (හෙක්ටයාරයකට කි.ග්‍රෑ.3,850) සියයට 5 කින් වැඩි වූ අතර, එය මෙතෙක් වාර්තා වූ ඉහළම අස්වනු අගයයි.

▲ 1999 වසරෙහි අග භාගයේදී සහල් ආනයනය සඳහා ප්‍රදානය කෙරුණු තීරු බදු සහන හේතුකොටගෙන සහල් තොග විශාල ප්‍රමාණයක් ආනයන කිරීමෙන් සහල් තොග රැස් වීම නිසා වී මිල ගණන් සියයට 12 කින් පහත වැටිණි.

▲ අපේක්ෂිත වූ මෝසම් වැසි ප්‍රමාද වීමෙන් මාස් කන්නයේ වී වගාවට එල්ල වූ අහිතකර බලපෑම හේතුකොටගෙන 2001 වසරේ වී නිෂ්පාදනය පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වී නිෂ්පාදනය




5.4 රූපසටහන

## වෙනත් ක්ෂේත්‍ර බෝග

▲ 2000 වසර තුළදී මිරිස්, අර්තාපල්, බඩඉරිඟු, ලොකු ළූණු සහ රතු ළූණු වැනි ක්ෂේත්‍ර බෝග අංශයන්හි මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කෙරේ.

මිරිස් සහ අර්තාපල් නිෂ්පාදනය




5.5 රූපසටහන

▲ ආනයන තීරු බදු අනුපාතයන් විශාල ලෙස ඉහළ නැංවීමෙන් ලැබුණු ආරක්ෂාවත්, සමූපකාර තොග වෙළඳ සංස්ථාව (සතොස) මගින් සහතික මිල ක්‍රමයක් ප්‍රදානය කිරීමත් හේතුකොටගෙන 2000 වසරේ අර්තාපල් නිෂ්පාදනය සියයට 54 කින් ඉහළ නැංවිණි.

▲ 2000 වසරේදී මිරිස් නිමැවුම සියයට 3 කින් පහත වැටුණි.

▲ 2001 වසරේදී අනෙකුත් ක්ෂේත්‍ර බෝග වගා අංශයේ නිෂ්පාදනය හිතකර වර්ධනයක් අත් කර ගනු ඇතැයි අපේක්ෂිතය.

*වෙනත් අපනයන බෝග*

▲ කෝපි, කුරුඳු, ගම්මිරිස් සහ කරාබුනැටි ආදී වෙනත් අපනයන බෝග ක්ෂේත්‍රවල නිෂ්පාදනය සියයට 2 කින් වර්ධනය විය.

▲ මෙකී අංශයේ අපනයන ඉපැයුම් ප්‍රමාණය, ප්‍රධාන අපනයන බෝග දෙකක් වන රබර් සහ පොල් අපනයනයන්ගෙන් ලැබූ ඉපයීම්වලට වඩා සියයට 5 කින් ඉහළ ගියේය.

▲ අනෙකුත් වැදගත් අපනයන බෝග අතරින් ගම්මිරිස් නිෂ්පාදනය සියයට 15 කින් ඉහළ ගියේය.

▲ ලෝකයේ කුරුඳු නිෂ්පාදනයෙන් තුනෙන් දෙකක ප්‍රමාණයකට දායක වන දේශීය කුරුඳු නිෂ්පාදනය 2000 වසරේදී තවදුරටත් වර්ධනය විය.

*ධීවර*

▲ පසුගිය වසර කිහිපය පුරා අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළ මත්ස්‍ය නිෂ්පාදනය 2000 වසරේදී තවදුරටත් ඉහළ ගියේය.

▲ මුහුදු සහ ජලජීවී යන දෙඅංශයෙහිම ඇති වූ ප්‍රගතිය සමස්ත වර්ධනයට දායක විය.

▲ රුපියල් අගය අනුව ගණනය කිරීමේදී අළුත් සහ අධි ශීත කරන ලද මසුන් අපනයනයෙන් ලැබුණු ඉපැයුම් ප්‍රමාණය සියයට 66 කින් ඉහළ ගියේය.

▲ 2001 දී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 2 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය.

*කුරුඳු සහ ගම්මිරිස් නිෂ්පාදනය*




5.6 රූපසටහන

*මත්ස්‍ය නිෂ්පාදනය*




5.7 රූපසටහන